## සමෘද්ධි ශුද්ධ ආරක්ෂණ මෙහෙයුම් හා ඇගයීම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන 2012

1. **මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැරුණු විට, මාගේ මතය වනුයේ,

(අ) 2012 ජනවාරි 01 සිට නොවැම්බර් 10 දක්වා කාලපරිච්ඡේදය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2012 නොවැම්බර් 10 දිනට වැඩසටහනේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව.

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) 2012 ජනවාරි 01 සිට නොවැම්බර් 10 දක්වා කාලපරිච්ඡේදය තුළ විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් වැඩසටහන විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2012 නොවැම්බර් 10 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ප්‍රදාන ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඊ) පදාන ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත් ය.

2. **මූල්‍ය ප්‍රකාශන**

----------------

2.1 **මූල්‍ය කාර්යසාධනය**

------------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු වලට අනුව, සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා වැඩසටහනේ වියදම රු.34,861,508 ක් වූ අතර 2012 නොවැම්බර් 10 දිනට සමුච්චිත වියදම රු.37,832,916 ක් විය. සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2012 නොවැම්බර් 10 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වර්ගය | වියදම<br>2012 ජනවාරි 01 සිට නොවැම්බර් 10 දක්වා කාලපරිච්ඡේදය සඳහා | 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2012 නොවැම්බර් 10 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| භාණ්ඩ | 8,928,228 | 956,300 | 9,884,528 |
| උපදේශක සේවා | 19,037,411 | 1,695,305 | 20,832,716 |
| පුහුණු, වැඩමුළු හා අධ්‍යයන චාරිකා | 6,674,142 | - | 6,674,142 |
| වැඩසටහන කළමනාකරණය | 221,727 | 219,803 | 441,530 |
| | 34,861,508 | 2,871,408 | 37,832,916 |

## 2.2 විශේෂ (ඩොලර්) ගිණුම

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු වලට අනුව, සමාලෝචිත කාලපරිච්ඡේදය තුල ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන ගිය විශේෂ (ඩොලර්) ගිණුමේ මෙහෙයුම් පහත දැක්වේ.

| | එ.ජ.ඩොලර් | ශ්‍රී.ලං.රු. |
|---|---|---|
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 224,081 | 25,523,074 |
| <u>එකතුකළා</u> | | |
| ඌනපූරණයන් | 70,405 | 9,389,147 |
| විදේශ විනිමය වාසිය | - | 3,314,533 |
| | 294,486 | 38,226,754 |
| <u>අඩුකළා</u> | | |
| ආපසු ගැනීම් | 231,276 | 30,007,825 |
| 2012 නොවැම්බර් 10 දිනට ශේෂය | 63,210 | 8,218,929 |

3. **විගණන නිරීක්ෂණ**

----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැඩසටහන උප සංරචක 12 ක් ඇතුලත් සංරචක 3 කින් සමන්විත වුවත්, වැඩසටහනේ නිශ්චිත කාලපරිච්ඡේදය තුල වැඩසටහනේ සම්පූර්ණ කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි වැඩසටහනේ අරමුණු ළඟාකර ගැනීම සහතික වීමට මාසිකව, කාර්තුමයව හා වාර්ෂිකව ආදී වශයෙන් මූල්‍ය හා භෞතික ඉලක්ක දක්වමින් විස්තරාත්මක ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, එවැනි සැලැස්මක් වැඩසටහන් කාලපරිච්ඡේදය අවසානය වන විටත් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2009 ජුලි 10 දින සිට බලපැවැත්වෙන පරිදි වර්ෂ 3 ක කාලපරිච්ඡේදයක් සඳහා වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණ ද අපේක්ෂිත ඉලක්කවලට අනුකූලව වැඩසටහන මෙහෙයවයේද යන්න තහවුරු කර ගැනීමට කිසියම් මෙහෙයුම් ක්‍රියාවලියක් අනුගමනය කරන ලද බව සනාථ කරන සාක්ෂි නොවීය.

(ඇ) සමාජ ආරක්ෂණ තාක්ෂණික ආධාර දූත කණ්ඩායමේ 2010 ඔක්තෝබර් 29 දිනැති කෙටුම්පත් ආධාර ලියවිල්ල අනුව, සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව (ස.කො.ජ.දෙ.) කළමනාකරණ තොරතුරු පද්ධතිය (ක.තො.ප.) පිළිබඳ ඇගයීමේ වාර්තාව 2012 ජුනි වන විට පිළයෙල කළ යුතු විය. කෙසේ වුවත්, එම කාර්යය 2013 මාර්තු 31 දින වන විටත් නිමකර නොතිබුණි.

(ඈ) සමෘද්ධි ශුද්ධ ආරක්ෂණ මෙහෙයුම් හා ඇගයීම් වැඩිදියුණු කිරීමේ වැඩසටහනේ ප්‍රදාන ගිවිසුමේ 2.03 (ඇ) ඡේදය ප්‍රකාරව වැඩසටහන නිමකිරීමේ දිනයෙන් මාස පහක් ඉකුත්වීමට පෙර වැඩසටහන නිමකිරීමේ වාර්තාව ලෝක බැංකුව වෙත ඉදිරිපත් කළයුතු විය. කෙසේ වුවත්, 2013 මාර්තු 31 දින වන විටත් එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) පදාන ගිවිසුම ප්‍රකාරව, 2012 ජුලි 09 දින හෝ ඊට පෙර වැඩසටහන නිම කළ යුතුව තිබුණි. මෙම දිනයෙන් ඔබ්බට වැඩසටහනේ ක්‍රියාකාරකම් කරගෙන ගොස් තිබුණ ද වැඩසටහනේ කාල පරිච්ඡේදය දීර්ඝ කර ගැනීම සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඊ) වැඩසටහනේ කාලපරිච්ඡේදය අවසානයේදී ඈවරකිරීමේ ගිණුම් පිළියෙල කළයුතු වුවත්, 2013 මාර්තු 31 දින වන විටත් වැඩසටහන, එම ගිණුම් පිළියෙල කර නොතිබුණු අතර ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වෙත වත්කම් පවරා නොතිබුණි.

## 4. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

-----------------------------------

### 4.1 අරමුදල් උපයෝජනය

----------------------

වැඩසටහන සඳහා ලෝක බැංකුවේ ආයතනික සංවර්ධන අරමුදල (ආ.සං.අ.) එකඟ වී තිබුණු මුළු ප්‍රදානය එ.ජ. ඩොලර් 450,000 ක් වූ අතර 2012 නොවැම්බර් 10 උන දක්වා දරන ලද සමුච්චිත වියදම එ.ජ. ඩොලර් 292,205.58 ක් විය. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ 2011 හා 2012 වර්ෂ වෙනුවෙන් රු. මිලියන එකක ශ්‍රී ලංකා රජයේ අරමුදල් ප්‍රතිපාදනයක් ද සලසා තිබුණි. වැඩසටහනේ කාලපරිච්ඡේදය තුල දරන ලද තථ්‍ය වියදම පහත දැක්වේ.

| වර්ෂය | තථ්‍ය වියදම | සමුච්චිත වියදම | ප්‍රදානයේ ප්‍රතිශතයක් ලෙස අරමුදල් උපයෝජනය |
|---|---|---|---|
| | එ.ජ.ඩො. | එ.ජ.ඩො. | % |
| 2009 | - | - | - |
| 2010 | 899.90 | 899.90 | 0.20 |
| 2011 | 65,114.58 | 66,014.48 | 14.67 |
| 2012 | 226,191.10 | 292,205.58 | 64.93 |

### 4.2 භෞතික කාර්යසාධනය

-------------------------

විගණනයට ලබාගත හැකිවූ තොරතුරු වලට අනුව, 2012 නොවැම්බර් 10 දිනට වැඩසටහනේ ආංශික වශයෙන් සමස්ත භෞතික කාර්යසාධනය පහත දැක්වේ.

| ක්‍රියාකාරකම | තත්ත්වය |
|---|---|
| සමෘද්ධි ශුද්ධ ආරක්ෂණ මෙහෙයුම් හා ඇගයීම් වැඩිදියුණු කිරීමේ වැඩසටහනේ ක්‍රියාකාරීත්වය හා පද්ධති අධ්‍යයනය | නිමකර ඇත |
| පද්ධති සංවර්ධනය | නිමකර ඇත |
| ස්වාධීන ඇගයීම | සිදුකර නැත |
| මෙහෙයුම් අත්පොත පිළියෙල කිරීම | සිදුකර නැත |
| මෘදුකාංගවල ගුණාත්මක බව සහතික කිරීම | ක්‍රියාකාරීත්වයේ පවතී |

| | |
|---|---|
| කළමනාකරණ තොරතුරු පද්ධතිය පිළිබඳව තාක්ෂණික කාර්ය මණ්ඩලයට පුහුණුවන්නන් හා ස්ථානගතවීම අනුව පුහුණු මෙහෙයවීම | කොටසක් නිමකර ඇත |
| පුහුණු කළමනාකරුවන් දිස්ත්‍රික් වශයෙන් දැනුවත් කිරීම | කොටසක් නිමකර ඇත |
| සමාන සහනාධාර වැඩසටහන නැවත ඇතිවීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය | සිදුකර නැත |
| සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට පරිගණක මධ්‍යස්ථාන හා ලැප්ටොප් පරිගණක | නිමකර ඇත |
| නියමු ස්ථාන 13 සඳහා පරිගණක මධ්‍යස්ථාන | නිමකර ඇත |
| පද්ධති මෙහෙයුම් සඳහා මූලික දෘඩාංග හා ජාල ඇති කිරීම | නිමකර ඇත |